# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2449/73 - 2025 අගෝස්තු මස 16 වැනි සෙනසුරාදා - 2025.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:-*

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 129, රිදියගම ග්‍රාම නිලධාරි වසමේ, රිදියගම ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 830255 හි කලාප අංක 02හි පත්‍ර අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.4481 ක් වූ ඉඩම් කැබලි.

01. **කැබලි අංක 03**

ඉඩමේ නම: කොග්ගල කැලේ; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 06ක්, වතුර ටැංකි 03ක්, ජල කුළුණක්, ජල වාතකයක් සහ මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අම්බලන්තෙට ප්‍රාදේශීය සභාව; ව්‍යවස්ථාපිත විවිධාන හා මැනීමට හේතු: ජාතික ජලසම්පාදන මණ්ඩලයට අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක්. 0.4396.

02. කැබලි අංක 04

ඉඩමේ නම: කොග්ගල්ල කැලේ; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ ජල කුළුණේ කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අම්බලන්තෙට ප්‍රාදේශීය සභාව; ව්‍යවස්ථාපිත විවිධාන හා මැනීමට හේතු: වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ජාතික ජල සම්පාදන මණ්ඩලයට අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක්. 0.0085.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 සැප්තැම්බර් මස 22 වැනි දින පෙ. ව. 10.30 ට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 සැප්තැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**චින්තා පී. ඩබ්. වන්නිආරච්චි,**
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2025 අගෝස්තු මස 13 වැනි දින,
අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0184